සැ.යු.- මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2019 වර්ෂය සඳහා ගාල්ල - බලපිටිය දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,121 - 2019 අප්‍රේල් මස 26 වැනි සිකුරාදා - 2019.04.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 906 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 912 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (සංශෝධන) පනත් කෙටුම්පත 2019 අප්‍රේල් මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 මැයි මස 17 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 මැයි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## නිවේදනය නැවත පළකිරීම

නවගත්තේගම ප්‍රාදේශීය සභාව

2019.03.08 දින පළකරන ලද අංක 2,114 *ගැසට් පත්‍රයේ* 03-324 නිවේදනය හා සම්බන්ධවයි. දියුණු කළ ප්‍රදේශයට අදළ සිතියම අතපසු වීමකින් එම නිවේදනයේ පළ වී නොමැති හෙයින් පහත සඳහන් ආකාරයට සිතියම සමග නිවේදනය නැවත පළකරනු ලැබේ.

එන්. වී. සෙනවිරත්න,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
පුත්තලම දිස්ත්‍රික්කය.

2019 අප්‍රේල් මස 11 වැනි දින,
පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

**නවගත්තේගම ප්‍රාදේශීය සභාව**

***දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කිරීම***

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නවගත්තේගම ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ දෙසැම්බර් මස 10 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 83 යටතේ සභාව සම්මත කරන ලද පහත සඳහන් යෝජනාවට එකී පනතේ ඉහත කී උපවගන්තියෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් ලෙස කටයුතු කරන මා විසින් අනුමැතිය දෙනු ලැබූ බව මහජනතාව වෙත මෙයින් ප්‍රකාශයට පත් කරමි.

එන්. වී. සෙනවිරත්න,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
පුත්තලම දිස්ත්‍රික්කය.

2019 පෙබරවාරි මස 18 වැනි දින,
පුත්තලම පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

*යෝජනාව*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර නවගත්තේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සිතියමෙන් සහ උපලේඛනයෙන් විස්තර කරන ප්‍රදේශය සඳහා උපරිම මට්ටමින් සේවාව ව්‍යාප්ත කිරීමට නවගත්තේගම ප්‍රාදේශීය සභාව කටයුතු කර ඇති හෙයින් දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් පිළිගත යුතු බවත්,

එම පිළිගැනීමේ යෝජනා සම්මුතියට පුත්තලම දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබාගැනීමට ක්‍රියා කළ යුතු බවටත් නවගත්තේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

දියුණුගම් ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට අදාළ වන නවගත්තේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අංක 644/3 මීයැල්ලෑව සහ 644 කිරිමැටියාව යන ග්‍රාම නිලධාරි කොට්ඨාසයන්ට අයත් වන පහතින් ඇති ප්‍රදේශයට මායිම්ව ඇති සිතියමින් දැක්වෙන ප්‍රදේශය.

| *අ. අංකය* | *අක්ෂාංශ* | *දේශාංශ* | *ඉඩමේ විස්තරය* |
|---|---|---|---|
| **A සිට B දක්වා වන උතුරු සීමාවේ සිට නැගෙනහිර සීමාව දක්වා ඛණ්ඩාංක මායිම්** | | | |
| 1 | 8.010742 | 80.106001 | ආසිරිගම මාර්ගයේ ආරම්භය සහිත නවගත්තේගම ගල්ගමුව මාර්ගය. |


| අ. අංකය | අක්ෂාංශ | දේශාංශ | ඉඩමේ විස්තරය |
|---|---|---|---|
| 2 | 8.009818 | 80.106100 | ආර්. ඒ. එම්. එච්. එම්. ටී. බී. රාජකරුණා මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ උතුරු මායිම. |
| 3 | 8.009710 | 80.106565 | ආර්. ඒ. එම්. එච්. එම්. ටී. බී. රාජකරුණා මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ නැගෙනහිර මායිම. |
| 4 | 8.009450 | 80.106596 | ආර්. ඒ. එම්. එච්. එම්. ටී. බී. රාජකරුණා මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ දකුණු මායිම. |
| 5 | 8.009394 | 80.106358 | ආර්. ඒ. එම්. එච්. එම්. ටී. බී. රාජකරුණා මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ දකුණු මායිම |
| 6 | 8.008554 | 80.106289 | ආර්. ඒ. එම්. එච්. එම්. ටී. බී. සීලවතී මහත්මියට අයත් ඉඩම ද ඇතුළත්ව එම ඉඩමේ දකුණු මායිම. |
| 7 | 8.007820 | 80.107458 | නවගත්තේගම කුඹුරු මාර්ගය සහිත ආර්. එච්. එම්. රංබණ්ඩා මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ නැගෙනහිර මායිම. |
| 8 | 8.007294 | 80.107052 | ආර්. එච්. එම්. රංබණ්ඩා මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ නැගෙනහිර මායිම. |
| 9 | 8.006390 | 80.107196 | ආර්. ඩී. නිමල් රාජකරුණා මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ නැගෙනහිර මායිම. |
| 10 | 8.005752 | 80.106443 | ඩබ්. එම්. සූරසේන වන්නිනායක මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ නැගෙනහිර මායිම. |
| 11 | 8.005281 | 80.106604 | තැපැල් කාර්යාලය අසල මාර්ගය |
| 12 | 8.005255 | 80.106989 | තැපැල් කාර්යාලය අසල මාර්ගය |
| 13 | 8.004613 | 80.106879 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ නැගෙනහිර මායිම. |
| 14 | 8.003929 | 80.106834 | ඒ. එම්. සුනිල් අප්පුහාමි මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ නැගෙනහිර මායිම. |
| 15 | 8.003881 | 80.106999 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ උතුරු මායිම. |
| 16 | 8.003429 | 80.107287 | සයිමන් නවගත්තේගම මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ උතුරු මායිම. |
| 17 | 8.003975 | 80.108447 | ආර්. ඩී. ගුණපාල මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ නැගෙනහිර මායිම. |
| 18 | 8.004139 | 80.109371 | නවගත්තේගම කුඹුරු මාර්ගය |
| 19 | 8.004135 | 80.109939 | ඩී. එම්. ජයතිලක මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ උතුරු මායිම. |
| 20 | 8.004580 | 80.110011 | ඩී. එම්. ජයතිලක මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ උතුරු මායිම. |
| 21 | 8.004811 | 80.111388 | ඩබ්. එම්. කීර්ති විජේකෝන් මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ උතුරු මායිම. |
| 22 | 8.004222 | 80.112016 | ඉගිණිමිටිය නවගත්තේගම මාර්ගය නවගත්තේගම පාසල ඉදිරිපිට මායිම. |
| **B සිට C දක්වා වන නැගෙනහිර සීමාවේ සිට දකුණු සීමාව දක්වා බණ්ඩාංක මායිම** | | | |
| 23 | 8.003614 | 80.112305 | නවගත්තේගම රෝහල අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ නැගෙනහිර මායිම |
| 24 | 8.002761 | 80.111420 | නවගත්තේගම රෝහල අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ දකුණු මායිම. |

| අ. අංකය | අක්ෂාංශ | දේශාංශ | ඉඩමේ විස්තරය |
|---|---|---|---|
| 25 | 8.002277 | 80.110000 | ආර්. ඩී. පීටර් මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ දකුණු මායිම. |
| 26 | 8.002701 | 80.109061 | ගැටදිවුල වැව මාර්ගය මායිම |
| 27 | 8.002186 | 80.108507 | ඩී. ඩී. ටිකිරා මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ දකුණු මායිම. |
| 28 | 8.002259 | 80.108132 | ජී. ඩී. රාජපක්ෂ මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ දකුණු මයිම. |
| 29 | 8.002387 | 80.108011 | ජී. ඩී. රාජපක්ෂ මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ දකුණු මායිම. |
| 30 | 8.002333 | 80.107819 | ජී. ඩී. රාජපක්ෂ මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ දකුණු මායිම. |
| 31 | 8.001970 | 80.107345 | ජී. ඩබ්. මංගලදේව මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ දකුණු මායිම. |
| 32 | 8.001276 | 80.107396 | එස්. එන්. එස්. බී. සේමසිංහ මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ දකුණු මායිම. |
| 33 | 8.001193 | 80.107172 | නවගත්තේගම පොළ පාර මායිම. |
| 34 | 8.001281 | 80.107121 | නවගත්තේගම පොළ පාර මායිම. |
| 35 | 8.001136 | 80.105847 | ඩබ්. එම්. උපුල් අනුරංග පෙරේරා මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ දකුණු මායිම. |
| 36 | 8.001155 | 80.105167 | ඩබ්. එම්. දිලාන් ප්‍රේම කුමාර මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ දකුණු මායිම. |
| 37 | 8.000831 | 80.104795 | බුද්ධ ජයසිරිගම ගම මැද මාර්ගය මායිම. |
| 38 | 8.000933 | 80.104628 | බුද්ධි ජයසිරිගම ගම මැද මාර්ගය මායිම |
| 39 | 8.000803 | 80.104512 | ආර්. එම්. චන්ද්‍රලතා මහත්මියට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ නැගෙනහිර මායිම. |
| 40 | 8.000637 | 80.104532 | ආර්. එම්. චන්ද්‍රලතා මහත්මියට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ නැගෙනහිර මායිම. |
| 41 | 7.999933 | 80.105305 | ඒ. ඩබ්. ආරියවංශ මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ නැගෙනහිර මායිම |
| 42 | 7.999597 | 80.105412 | ඒ. ඩබ්. ආරියවංශ මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ නැගෙනහිර මායිම. |
| 43 | 7.999452 | 80.105298 | ඒ. ඩබ්. ආරියවංශ මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ නැගෙනහිර මායිම. |
| 44 | 7.999705 | 80.104307 | එස්. එම්. විමලා කුමාරිහාමි මහත්මියට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ නැගෙනහිර මායිම. |
| 45 | 7.998126 | 80.103494 | හේරත් මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ නැගෙනහිර මායිම |
| 46 | 7.998866 | 80.102611 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩම ද ඇතුළත් ව එම නැගෙනහිර මායිම |
| 47 | 7.998824 | 80.102506 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩම ද ඇතුළත් ව එම නැගෙනහිර මායිම |
| 48 | 7.997816 | 80.103363 | නවගත්තේගම පොලීසියට අයත් ඉඩම ද ඇතුළත් ව එම නැගෙනහිර මායිම. |
| 49 | 7.997283 | 80.102843 | වන සංරක්ෂණ කාර්යාලයට අයත් ඉඩම ද ඇතුළත් ව එම නැගෙනහිර සහ දකුණු මායිම. |
| **C සිට D දක්වා වන දකුණු සීමාවේ සිට බස්නාහිර සීමාව දක්වා ඛණ්ඩාංක මායිම** | | | |
| 50 | 7.998857 | 80.101739 | වන සංරක්ෂණ කාර්යාලය ඉදිරිපිට ආණමඩුව නවගත්තේගම මාර්ගය මායිම |

| අ. අංකය | අක්ෂාංශ | දේශාංශ | ඉඩමේ විස්තරය |
|---|---|---|---|
| 51 | 7.999406 | 80.101293 | වන සංරක්ෂණ කාර්යාලය ඉදිරිපිට මාර්ගය මායිම. |
| 52 | 7.999851 | 80.101615 | ආර් ඩී. සොපියා මහත්මියට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 53 | 8.000042 | 80.101823 | ආර්. ඩී. සොපියා මහත්මියට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 54 | 8.000146 | 80.101714 | ආර්. ඩී. සොපියා මහත්මියට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 55 | 8.000638 | 80.102113 | ඩබ්. එම්. ගාමිණී වර්ණසූරිය මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 56 | 8.000760 | 80.102115 | ඩබ්. එම්. ගාමිණී වර්ණසූරිය මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 57 | 8.001101 | 80.102367 | ඩබ්. එම්. විල්බට් පෙරේරා මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 58 | 8.000896 | 80.102883 | ඩබ්. එම්. විල්බට් පෙරේරා මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම |
| 59 | 8.001360 | 80.102999 | ඩබ්. එම්. ජේ. වර්ණසූරිය මහතාට අයත් ඉඩමද ඇතුලුව නවගත්තේගම කරුවලගස්වැව මාර්ගය සහිත මායිම. |
| 60 | 8.001288 | 80.103415 | නවගත්තේගම කරුවලගස්වැව මාර්ගය සහිත මායිම. |
| 61 | 8.001354 | 80.103515 | ඩබ්.එම්. රෝහණ වර්ණසූරිය මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 62 | 8.001875 | 80.103361 | ඩබ්. එම්. රොහාන් වර්ණකුලසූරිය මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 63 | 8.002325 | 80.103528 | ඩී. එම්. චන්දන මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 64 | 8.002917 | 80.104658 | හීනාගම මාර්ගය සහිත මායිම |
| **D සිට A දක්වා වන බස්නාහිර සීමාවේ සිට උතුරු සීමාව දක්වා ඛණ්ඩාංක මායිම්** | | | |
| 65 | 8.003302 | 80.104429 | හීනාගම මාර්ගය සහිත මායිම |
| 66 | 8.003410 | 80.104673 | ඩබ්. එම් පුංචිබණ්ඩා මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 67 | 8.003349 | 80.104854 | ඩබ්. එම්. කුසුමාවතී මහත්මියට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 68 | 8.003334 | 80.105040 | ඩබ්. එම්. කුසුමාවතී මහත්මියට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 69 | 8.003657 | 80.105187 | නවගත්තේගම පොදු බස් නැවතුම්පල පිහිටි ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 70 | 8.004214 | 80.104820 | සෝමාවතී මහත්මියට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 71 | 8.004473 | 80.104804 | ජයසිංහ මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 72 | 8.005088 | 80.104547 | දිසානායක මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම |
| 73 | 8.005310 | 80.104232 | ආර්. එච්. එම්. ගාමිණී රාජකරුණා මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 74 | 8.006039 | 80.104237 | ඩබ්. එම්. නිහාල් ශාන්ත වර්ණකුලසූරිය මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |

| අ. අංකය | අක්ෂාංශ | දේශාංශ | ඉඩමේ විස්තරය |
|---|---|---|---|
| 75 | 8.006588 | 80.104073 | ඩබ්. එම්. මහින්ද වර්ණකුලසූරිය මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 76 | 8.006895 | 80.104291 | ගොවිජන සේවා මධ්‍යස්ථානය අසල මාර්ගය සහිත මායිම. |
| 77 | 8.006824 | 80.104951 | ගොවිජන සේවා මධ්‍යස්ථානය අසල මාර්ගය සහිත මායිම. |
| 78 | 8.007888 | 80.105032 | එච්. එම්. කිරිබංඩා මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 79 | 8.008108 | 80.104705 | එච්. එම්. කිරිබංඩා මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 80 | 8.008455 | 80.104591 | එච්. එම්. විමලරත්න මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 81 | 8.008506 | 80.104508 | විජේසූරිය මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 82 | 8.008455 | 80.104331 | චන්දන සෙනවිරත්න මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 83 | 8.008358 | 80.104293 | විජේසූරිය මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 84 | 8.008356 | 80.104206 | විජේසූරිය මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 85 | 8.009071 | 80.104204 | දිසානායක මහතාට අයත් ඉඩම ද ඇතුළත් ව එම ඉඩමේ බටහිර මායිම. |
| 86 | 8.009903 | 80.104606 | නිවාස 10 ඉදිරිපිට මාර්ගය සහිත මායිම. |
| 87 | 8.009784 | 80.105296 | ආර්. එච්. එම්. සරත් ගාමිනි රාජකරුණා මහතාට අයත් ඉඩම ද ඇතුළත්ව එම ඉඩමේ බටහිර මායිම. |
| 88 | 8.010284 | 80.105380 | ආර්. එච්. එම්. සරත් ගාමිනි රාජකරුණා මහතාට අයත් ඉඩම ද ඇතුළත්ව එම ඉඩමේ බටහිර මායිම. |
| 89. | 8.010503 | 80.104748 | එන්. ඩබ්. ඒ. නිමල් සිරි මහතාට අයත් ඉඩම ද ඇතුළත්ව එම ඉඩමේ බටහිර මායිම. |
| 90 | 8.011252 | 80.104840 | එන්. ඩබ්. ඒ. නිමල් සිරි මහතාට අයත් ඉඩම ද ඇතුළත්ව එම ඉඩමේ බටහිර මායිම. |
| 91 | 8.011160 | 80.105190 | ආසිරිගම මාර්ගය සහිත මායිම |
| 92 | 8.010953 | 80.105434 | ආසිරිගම මාර්ගය සහිත මායිම |
| 93 | 8.010878 | 80.105784 | ආසිරිගම මාර්ගය සහිත මායිම |

# Nawagaththegama pradeshiya sabha development area



# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - බස්නාහිර පළාත් සභාව

### හෝමාගම (පිරිමි) වල්පිට (කාන්තා) දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයන්හි පැවැත්වෙන එක් අවුරුදු වෘත්තීය කෘෂිකර්ම පුහුණු පාඨමාලාව හා සමගාමීව "ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම)" ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 4) පුහුණු පාඨමාලාව - 2019/2020

බස්නාහිර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් ඉහත පාඨමාලාව හැදෑරීම සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගැනීම පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ. පාඨමාලාව පවත්වනු ලබන්නේ සිංහල මාධ්‍යයෙනි. මෙම පාඨමාලාව කෘෂිකාර්මික අංශයේ රැකියා අවස්ථා සඳහා මෙන්ම ස්වයං රැකියා පදනමක් මත ක්‍රියාත්මක වීමට ඉදිරිපත් වන්නන් සඳහා ඉලක්ක කර ඇත.

02. ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණුවක් ලෙස පවත්වනු ලබන මෙම පාඨමාලාව සාර්ථකව නිමකරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සහතික පත්‍ර ප්‍රදානය කරනු ලැබේ. තව ද තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙතින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 4) සහතික ලබා ගැනීමට ද අවස්ථාව සලසා දෙනු ලබයි. පාඨමාලාවේ අන්තර්ගත විෂයයන් පහත පරිදි වේ.

NVQ 4 ට අදාළව,

- (i) M - 01 - බිම් සැකසීම හා පාංශු සංරක්ෂණය අධීක්ෂණය
- (ii) M - 02 - පැළ තවාන සංස්ථාපනය හා නඩත්තුව අධීක්ෂණය
- (iii) M - 03 - ක්ෂේත්‍රයේ බෝග සංස්ථාපනය හා නඩත්තුව අධීක්ෂණය
- (iv) M - 04 - ඵල නෙලීම හා අස්වනු සැකසීම - අධීක්ෂණය
- (v) M - 05 - යන්ත්‍රෝපකරණ භාවිතය හා නඩත්තුව අධීක්ෂණය
- (vi) M - 06 - පරිපාලන ක්‍රියාකාරකම්
- (vii) M - 07 - වෘත්තීය ආරක්ෂාව

සහ අතිරේකව සත්ව පාලනය, වී වගාව, ගෘහ ආර්ථික විද්‍යාව, ව්‍යවසායකත්වය.

ඉහත විෂයයන් ඔස්සේ පාඨමාලාව ඉදිරිපත් කිරීමේ දී නව කෘෂිකාර්මික තාක්ෂණ වර්ධනයට අදාළ නවතම සොයා ගැනීම් (උදා.- පසු අස්වනු තාක්ෂණය, හරිතාගාර වගා ක්‍රම), ස්වයං රැකියා උපාය මාර්ග (උදා.- භූමි දර්ශ ස්ථාපනය, ගොවිපල ගිණුම්, ගොවිපළ උපකරණ නඩත්තුව හා ට්‍රැක්ටර් යන්ත්‍ර පැදවීම හුරු කිරීම) සහ තොරතුරු සැකසීමේ නව ක්‍රම සඳහා හුරුවක් ලබා දීම ද (උදා.- පරිගණක භාවිතය) සිදුකරනු ඇත. එසේම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ඉංග්‍රීසි දැනුම වර්ධනය සහ කාලීනව බල පවත්වන කෘෂිකාර්මික ප්‍රතිපත්ති පිළිබඳ අවබෝධයක් ද ලබා දෙනු ඇත.

03. *පාඨමාලාව පවත්වාගෙන යාම :*

වසරක කාලයකින් සමන්විත පාඨමාලාවේ අධ්‍යයන වාර තුනක් වේ. දෙවන වාර අවසානයේ දී එනම් මොඩියුල හදාරා නිම වූ පසු ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වේ. තව ද මෙම මොඩියුල කාල සීමාව තුළ අඛණ්ඩ ඇගයීම ද දිගටම සිදු කෙරේ. පළමු හා දෙවන වාර තුළ දී අධ්‍යයන චාරිකා ද සැලසුම් කර ඇත. තුන්වන වාරය තුළ දී සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවකටම තමන් තෝරා ගත් විෂය ක්ෂේත්‍රයන් මත බාහිර කෘෂිකර්ම ව්‍යාපාරයක්/ආයතනයක් සමග සම්බන්ධ වී ව්‍යාපෘති අධ්‍යයනයක් සිදු කළ යුතු වේ. එම කාර්යය නිමාවත් සමග අවසාන ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පවත්වනු ඇත. පාඨමාලාවට පැමිණීම 85%ක් සම්පූර්ණ කරමින් අඛණ්ඩ ඇගයීමක් තුලින් සමත් වන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත පාඨමාලාව අවසානයේ සහතික පිරිනමනු ලැබේ. එසේම මෙම ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙතින් ක්ෂේත්‍ර සහකාර (කෘෂිකර්ම) - NVQ 4 තෘතීයික වෘත්තීය සුදුසුකම් සහතික ලබා ගැනීමට ද අවස්ථා සලසා දෙනු ලැබේ.

04. *බඳවා ගැනීමේ පරිපාටිය.-*

04.1 *අධ්‍යාපනික සුදුසුකම් :*

1. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල භාෂාව (භාෂාව හා සාහිත්‍ය), ගණිතය, විද්‍යාව, සමාජ අධ්‍යයනය හා තාක්ෂණික විෂය, (කෘෂිකර්මය, මැහුම් වැඩ, ගෙවතු වගාව, ගෘහ ආර්ථික විද්‍යාව, වාණිජ්‍යය හා ගිණුම්, මෝටර් කාර්මික ශිල්පය) ඇතුළුව සම්මාන 02ක් සහිතව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම.

04.2 *වෙනත් සුදුසුකම්.-*

(i) සියලුම අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 17ත් 25ත් අතර විය යුතුය.
(ii) අයදුම්කරුවන් අවිවාහක විය යුතුය.
(iii) ප්‍රායෝගික කෘෂිකර්මයේ නියැලීමට සුදුසු සෞඛ්‍ය තත්ත්වයෙන් පසුවිය යුතුය.
(මෙය සනාථ කිරීමට රජයේ වෛද්‍ය නිලධාරියකුගෙන් ලබාගත් සහතිකයක් පාඨමාලාව ආරම්භයේ දී ඉදිරිපත් කළ යුතු ය.)
(iv) සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් බස්නාහිර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකින් තෝරාගනු ලැබේ.
(v) කෘෂිකර්ම කටයුතුවල නිරත පුද්ගලයෙකු වීම හා එය වෘත්තියක් වශයෙන් ඉදිරියට ගෙන යාමට සූදානම් අයවලුන් වෙත විශේෂ අවධානය යොමු කෙරේ.
(vi) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් වූ වර්ෂ තුනක කාලය තුළ අඩුම වශයෙන් වර්ෂ දෙකක්වත් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබූ බවට පදිංචි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් පදිංචිය පිළිබඳ සහතිකයකින් සනාථ කළ යුතුය.

ඊට අතිරේකව,

අධ්‍යාපන හා අනෙකුත් අවශ්‍යතාවයන් සපුරාලන බස්නාහිර පළාතේ පදිංචිකරුවෙකු නොවන අයෙකු පාඨමාලාව හැදෑරීමට කැමැත්තක් දක්වන්නේ නම්, ඔවුන්ට ද ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් සලසනු ලැබේ. එසේ වුව ද, අයදුම්කරුවන් තෝරා ගැනීමේ දී ඉහළම ප්‍රමුඛස්ථානය ලබා දෙන්නේ, බස්නාහිර පළාතේ පදිංචිකරුවන් සඳහා වේ. බස්නාහිර පළාතේ පදිංචි අයගෙන් ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන්නේ නම්, පිට පළාත්වල අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීමට තීරණය කර ඇත.

05. *පාඨමාලාව සඳහා දිරි ගැන්වීමේ දීමනා.-*

(i) පුහුණුව ලබන කාලය තුළ, පුහුණුවට පැමිණෙන දිනකට එක් අයෙකු සඳහා රුපියල් පන්සියයක (රු. 500) පුහුණු දිරි ගැන්වීමේ දීමනාවක් ගෙවනු ලබන අතර, එය ආහාර පාන සඳහා වැය කිරීමට සිදුවනු ඇත.

(ii) නේවාසිකාගාර පහසුකම් පුහුණුව ලබන කාලය තුළ දී සෑම සිසුවකුටම නොමිලේ සපයනු ලැබේ.

06. පාඨමාලාවට සහභාගිවීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පරිපාටිය.-

(i) රුපියල් පන්සියයක (රු. 500/-) තැන්පතුවක් තැබිය යුතු ය.

(ii) පුහුණුවෙන් පසු කෘෂිකර්මාන්තයේ නියැලීම පිණිස අවශ්‍ය මූලික පහසුකම් සුළු ප්‍රමාණයක් හෝ තිබිය යුතු ය.

(iii) පුහුණුවෙන් පසු රජයේ රැකියාවක් සැපයීමට බස්නාහිර පළාත් සභාව හෝ මධ්‍යම රජය බැඳී නොමැති බව විශේෂයෙන් අවධාරණය කෙරේ.

(iv) පුහුණුව ලබන කාලය තුළදී පුහුණු ආයතන විසින් පවත්වනු ලබන පොදු නීති-රීති වලට එකඟ වන බවට ලිඛිතව ප්‍රකාශ කළ යුතු ය.

(v) පුහුණු කාල සීමාව තුළ විනය විරෝධී හා නීති-රීති වලට පටහැනිව කටයුතු කරන්නන්ගේ ශිෂ්‍යභාවය අහෝසි කිරීමට බලධාරීන් විසින් කටයුතු කරනු ලැබේ.

07. මෙහි පහත සඳහන් ආකෘතිය අනුව පිළියෙල කරගත් අයදුම්පත් අඟල් 8 1/2 x 12 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් 2019 ජුනි 30 වැනි දිනට හෝ එදිනට පෙර **"පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බස්නාහිර), පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, අංක 204, නව පළාත් සභා ගොඩනැගිල්ල, 7 වැනි මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල"** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අයදුම්පත බහාලන කවරයේ වම්පස උඩ කෙලවරේ,

**"2019/2020 වසර සඳහා එක් අවුරුදු වෘත්තීය කෘෂිකර්ම පුහුණු පාඨමාලාව සඳහා අයදුම්පත"** යනුවෙන් ලියා එවිය යුතුය.

(i) බඳවා ගැනීම සම්බන්ධව අවසාන තීරණය බස්නාහිර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ සතුය.

(ii) අසම්පූර්ණ හෝ අවිධිමත් ඉල්ලුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ තෝරාගත් සීමිත අයදුම්කරුවන් සංඛ්‍යාවක් පමණි.

(iii) දැනට පාසල් හැරගොස් ඇති ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට පමණක් සැලකිල්ලක් දක්වන බැවින් සම්මුඛ පරීක්ෂණයේ දී පාසල් හැරයාමේ සහතිකය අනිවාර්යෙන්ම ඉදිරිපත් කළ යුතුය.

(iv) තමා අධ්‍යාපනය ලැබූ විද්‍යාලයෙන් සහ ප්‍රදේශයේ ප්‍රභුවරයෙකුගෙන් මෑතක දී ලබාගත් චරිත සහතිකවල පිටපත් දෙකක්, අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් සඳහා සහතිකවල පිටපත් අයදුම් පත්‍රයට යා කර එවිය යුතුය.

(v) ජාතික හැඳුනුම්පත සමග අධ්‍යාපන හා වෙනත් සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී පමණක් ඉදිරිපත් කළ යුතුය.

උත්පලා අමරකෝන්,<br>
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ *(වැ. බ.),*<br>
බස්නාහිර.

2019 අප්‍රේල් මස 05 වැනි දින,<br>
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බස්නාහිර),<br>
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය,<br>
නව පළාත් සභා ගොඩනැගිල්ල, අංක 204,<br>
7 වන මහල,<br>
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,<br>
බත්තරමුල්ල.

**හෝමාගම (පිරිමි) වල්පිට (කාන්තා) දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයන්හි පැවැත්වෙන එක් අවුරුදු වෘත්තීය කෘෂිකර්ම පුහුණු පාඨමාලාව හා සමගාමීව "ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම)" ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 4) පුහුණු පාඨමාලාව 2019/2020 සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගැනීමේ ආදර්ශ අයදුම්පත්‍රය**

1. අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :..........................................................................................................
...........................................................................................................................................

2. මුලකුරු සමග නම :..........................................................................................................
...........................................................................................................................................

3. (i) ස්ථිර ලිපිනය :..........................................................................................................
(ii) පදිංචි දිස්ත්‍රික්කය :..........................................................................................................

4. අපේක්ෂකයාගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |

5. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |

6. (i) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ඃ

(ii) පදිංචි දිස්ත්‍රික්කය ඃ

(iii) ජංගම දුරකථන අංකය ඃ

(iv) නිවසේ දුරකථන අංකය ඃ

7. ස්ත්‍රී/පුරුෂ භාවය ඃ ස්ත්‍රී ඃ ☐ පුරුෂ ඃ ☐

8. උපන් දිනය ඃ වර්ෂය ඃ මාසය ඃ දිනය ඃ

9. (i) හැඳුනුම්පත් අංකය ඃ

(ii) හැඳුනුම්පත නිකුත් කළ ආයතනය හා දිනය ඃ..........................................................

10. පියාගේ හෝ භාරකරුගේ නම ඃ..........................................................

11. පියාගේ හෝ භාරකරුගේ ලිපිනය ඃ..........................................................

12. *අධ්‍යාපන සුදුසුකම්.-*

*(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය* (................වර්ෂය)

| *සමත් විෂයයන්* | *ලැබූ සාමාර්ථයන්* | *සමත් විෂයයන්* | *ලැබූ සාමාර්ථයන්* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

*(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය* (................වර්ෂය)

| *සමත් විෂයයන්* | *ලැබූ සාමාර්ථයන්* | *සමත් විෂයයන්* | *ලැබූ සාමාර්ථයන්* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

*(ඇ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උ. පෙළ) විභාගය* (............වර්ෂය)

| *සමත් විෂයයන්* | *ලැබූ සාමාර්ථයන්* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

13. වෙනත් බාහිර සුදුසුකම් හා බාහිර ක්‍රියාකාරකම් ඃ

(i) ..........................................................................................
(ii) ..........................................................................................
(iii) ..........................................................................................

14. ඔබ උසස් අධ්‍යාපන ආයතනයක හෝ කාර්මික විද්‍යාලයක/ආයතනයක පාඨමාලාවක් සඳහා තේරී පත්වී සිටී ද? එසේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න. ..........................................................................................................................
..........................................................................................................................................................

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. කිසියම් තොරතුරක් අසත්‍ය යැයි මා තෝරා ගැනීමෙන් පසු එළිදරව් වුවහොත් කිසිම පරීක්ෂණයකින් තොරව මාගේ ආධුනිකභාවය අවලංගු වන බව දනිමි.

..........................................
අයදුම්කරුගේ අත්සන.

දිනය ඃ............................

04-924

---

## සංශෝධනයයි

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

### වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018

ඉහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීමට අදාළව 2018.12.14 දින අංක 2102 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 12-522/1 නිවේදනයේ පහත සඳහන් ඡේද සංශෝධනය කරනු ලැබේ.

ඡේදය 3. ii මෙම තනතුර සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන් 2019.01.14 දිනට පූර්වාසන්න වසර තුනක (03) කාලය තුළ වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය. (ප්‍රාදේශීය ලේකම්වරයා අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි සහතිකයක් මගින් පදිංචිය සනාථ කළ යුතුය.)

3. iii 2019.01.14 දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 40ට නොවැඩි විය යුතු ය.

ඡේදය 3. iv බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු අධ්‍යාපන, වෘත්තීය හා වෙනත් සුදුසුකම් 2019.01.14 දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර සහතික ලබා තිබිය යුතු ය.

ඡේදය 9.4 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2019.05.10 වේ.

02. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2019.05.10 දක්වා දීර්ඝ කරනු ලැබුව ද 2018.12.14 දිනැති ඉහත අංක දරන *ගැසට්* නිවේදනයේ සඳහන් පරිදි සියලු සුදුසුකම් 2019.01.14 දිනට සපුරා තිබිය යුතුය.

03. 2018.12.14 දිනැති අංක 2102 දරන *ගැසට්* පත්‍රයේ IV (අ) පළාත් සභා කොටසෙහි පළ කරන ලද ඉහත තනතුරට බඳවා ගැනීමේ *ගැසට්* නිවේදනයට අනුව අයදුම්පත්‍ර යොමු කළ අයදුම්කරුවන් නැවත අයදුම් කිරීම අවශ්‍ය නොවේ.

04. මෙම තනතුරට බඳවා ගැනීම සඳහා වන අංක 2102 හා 2018.12.14 දිනැති *ගැසට්* නිවේදනයේ සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින්ම බලපැවැත්වේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

පද්මිණි කාරියවසම්,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2019 අප්‍රේල් මස 17 වැනි දින,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

04-1119

---

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

වයඹ පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රීඩා නිලධාරි III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීම - 2019
(විවෘත)

වයඹ පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ පළාත් සභා රාජ්‍ය සේවයේ ක්‍රීඩා නිලධාරි III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම්ලත් වයඹ පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *වැටුප් ක්‍රමය :-*

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය MT-2-2016 අනුව රුපියල් 30,140-10x350-11 x 370-10 x 560-10 x 660-49,910 වේ.

නමුත් 2020.01.01 දක්වා වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

2. *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :-*

2.1 *අධ්‍යාපන සුදුසුකම් :*

*(අ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/දෙමළ සහ තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සහිතව ගණිතය හා ඉංග්‍රීසි භාෂාවද ඇතුළත්ව විෂයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම.

*සහ*

දකුණු ආසියාතික තරග, ආසියාතික තරග, පොදු රාජ්‍ය මණ්ඩලීය තරග, ඔලිම්පික් තරග හෝ ලෝක ශූරතා තරග සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කර තිබීම.

*හෝ*

*(ආ)* අධ්‍යායන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/දෙමළ සහ තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සහිතව ගණිතය හා ඉංග්‍රීසි භාෂාව ද ඇතුළත්ව විෂයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම.

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් 3ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

*සහ*

i. පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙල හා සමගාමී පළාත් තරග (දිස්ත්‍රික් අතර) තනි ඉසව් හෝ කේවල තරගවලදී 1,2 ස්ථාන ද, කණ්ඩායම් තරගවලදී 1 වන ස්ථානය ද ලබා තිබීම.

*හෝ*

ii. ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලකදී හෝ ජාතික ක්‍රීඩා සංගම් මගින් පවත්වනු ලබන ජාතික ශූරතා තරගාවලියකදී තනි ඉසව් හෝ කේවල තරගවලදී 1, 2, 3 ස්ථානද කණ්ඩායම් තරගවලදී 1, 2 ස්ථානද ලබා තිබීම.

ඉහත සඳහන් සුදුසුකම් යටතේ බඳවා ගන්නා නිලධාරීන් වසර 05ක් ඇතුළත තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා NVQ හය (06) මට්ටමේ වන්නා වූ ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික ඩිප්ලෝමාවක් ලබා ගැනීම අවශ්‍ය වේ. මෙම ජාතික වෘත්තීය කුසලතා NVQ හය (06) මට්ටමේ වන්නා වූ ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික ඩිප්ලෝමාවක් පළමු වසර 05 තුළ සමත් නොවුනහොත් ඔවුන්ගේ වැටුප් වර්ධක විලම්බනය කරනු ලැබේ. (ක්‍රීඩා උපාධිය ලබා ඇති අය මෙම අවශ්‍යතාවයෙන් නිදහස් කෙරේ.)

2.2 *කායික සුදුසුකම් :-*

සෑම අපේක්ෂකයකුම වයඹ පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

2.3 *වෙනත් සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) තරග විභාගට පෙනී සිටින අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03කට නොඅඩු කාලයක් වයඹ පළාත් සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය. (ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී පදිංචිය සනාථ කළ යුතුය.)

(iv) අයැදුම්පත් භාරගන්නා අවසාන දිනට අවු. 18ට නොඅඩු හා අවු. 35ට නොවැඩි විය යුතුය.

(v) බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු අධ්‍යාපන, වෘත්තීය හා වෙනත් සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සම්පූර්ණ කර සහතික ලබා තිබිය යුතුය.

*සංලක්ෂ්‍යය.-* ආගමික පූජකවරයෙකු හෝ ආගමික නිකායක පැවිදිවරයක් දරන තැනැත්තෙකු මෙම තනතුර සඳහා සුදුසුකම් නොලබයි.

3. *සේවා කොන්දේසි :*

3.1 මෙම තනතුර ස්ථිර ය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් වේ.

3.2 මෙම තනතුරට පත් කරනු ලබන්නන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර ඔහු/ඇය පරිවාස කාලය තුල සිය රාජකාරී වැඩ සහ හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබේ නම් හා සේවය ස්ථිර කිරීම සඳහා වන අනෙකුත් අවශ්‍යතාවයන් සම්පූර්ණ කර තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.

3.3 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014ට අනුව හා ඊට ආනුශංගික චක්‍රලේඛ අනුව සේවයට බැඳී වසර 05ක් ඇතුලත සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව/භාෂා පිළිබඳ ප්‍රවීනතාව ලබාගත යුතුය.

3.4 මෙම තනතුර සඳහා වූ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, මුදල් රෙගුලාසි වලටද, වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහය, වයඹ පළාත් විනය කාර්ය සංග්‍රහය, වයඹ පළාත් සභා කාර්ය පරිපාටික රීති, දෙපාර්තමේන්තු නියෝග හා රජය හා වයඹ පළාත් සභාව විසින් පනවනු ලබන වෙනත් විධිවිධාන වලට යටත් විය යුතුය.

4. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයකින් සුදුස්සන් තෝරාගනු ලැබේ. මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති, ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් වන්නන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ප්‍රමුඛතාවය මත බඳවා ගනු ලැබේ.

4.1 *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය.-*

| *ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *ලකුණු ලබා දෙන ආකාරය* | *ලකුණු ප්‍රමාණයන්* | | | *උපරිම ලකුණු* |
|---|---|---|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | අ. *ක්‍රීඩා ඩිප්ලෝමා :*<br><br>තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා මට්ටමේ ක්‍රීඩා ඩිප්ලෝමාව | 10 | | | 10 |
| | ආ. *උපාධිය :*<br><br>පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් ලබාදෙන ක්‍රීඩා උපාධිය | 10 | | | |
| 2. ක්‍රීඩා දක්ෂතාවයන් | අ. *පළාත් තරග :*<br><br>පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලට සමගාමී පළාත් (අන්තර් දිස්ත්‍රික්) තනි ඉසව් හෝ කේවල තරගාවලියකදී ලබාගත් ජයග්‍රහණ සඳහා (උපරිම සහතික 3ක් සඳහා) | 1<br>ස්ථානය | 2<br>ස්ථානය | 3<br>ස්ථානය | |
| | | 4x3<br>12 | 3 x 3<br>9 | ලකුණු හිමි නොවේ | 12 |

| *ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *ලකුණු ලබා දෙන ආකාරය* | *ලකුණු ප්‍රමාණයන්* | | | *උපරිම ලකුණු* |
|---|---|---|---|---|---|
| 2. ක්‍රීඩා දක්ෂතාවයන් | *ආ. ජාතික තරග :*<br><br>ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලකදී හෝ ජාතික ක්‍රීඩා සංගම් මගින් පවත්වනු ලබන ජාතික ශූරතා තරගාවලියකදී ලබාගත් ජයග්‍රහණ සඳහා (උපරිම සහතික 3ක් සඳහා) | 6 x 3<br>18 | 4 x 3<br>12 | 3 x 3<br>9 | 18 |
| | *ඇ. ජාත්‍යන්තර තරග :*<br><br>(එක් සහතිකයක් සඳහා උපරිම ලකුණු හිමිවේ) දකුණු ආසියාතික තරග, දකුණු ආසියාතික ශූරතා, ආසියානු ක්‍රීඩා උළෙල, ආසියාතික ශූරතා, පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල, පොදු රාජ්‍ය මණ්ඩලීය ශූරතා, ලෝක ශූරතා, ලෝක කුසලතා, ඔලිම්පික් තරග | 1,2,3 ස්ථාන<br>40<br>(උපරිම ලකුණු) | සහභාගිත්වය<br>20<br>(උපරිම ලකුණු) | | 40 |
| 3. අතිරේක පළපුරුද්ද | ක්‍රීඩා තරග පුහුණු කිරීම්, විනිශ්චය/සංවිධානය පිළිබඳ අතිරේක පළපුරුද්ද, සේවා පරිපාටියේ 7.4.2 හි වගන්ති වලින් විස්තර වන දිස්ත්‍රික්, පළාත්, ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ තරග සඳහා තරග පුහුණු කිරීම/විනිශ්චය කිරීම හෝ සංවිධානය කිරීම සඳහා පමණක් ලකුණු හිමි වේ. (ජාතික හෝ ජාත්‍යන්තර ක්‍රීඩා සංගම් විසින් ප්‍රදානය කළ සහතික/බලපත්‍ර ඉදිරිපත් කළ යුතුය)<br>දිස්ත්‍රික්/පළාත් තරග<br>ජාතික තරග<br>ජාත්‍යන්තර තරග | 05<br>07<br>10 | | | 10 |
| 4. ජාත්‍යන්තර භාෂා ප්‍රවීනතාවය | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂා විෂය සඳහා A හෝ B සාමාර්ථයක් ලබා තිබීම. | | | | 05 |
| 5. පෞරුෂත්වය | | | | | 05 |
| මුළු ලකුණු | | | | | 100 |

*සංලක්ෂ්‍යය :* ඉහළම ක්‍රීඩා දක්ෂතාවයට පමණක් ලකුණු හිමිවේ. එක් තරගයක (පළාත්/ජාතික) සහතික කිහිපයක් ඉදිරිපත් කළද එක් සහතිකයකට පමණක් ලකුණු හිමි වේ.

4.2 මූලික සුදුසුකම් පරීක්ෂාකිරීමෙන් අනතුරුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ප්‍රමුඛතාවය මත පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් ප්‍රායෝගික පරීක්ෂණයට ඉදිරිපත් කරනු ලැබේ.

4.3 ප්‍රායෝගික පරීක්ෂණය :

ශාරීරික යෝග්‍යතාවය පිරික්සීම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්මේන්තුවේ ක්‍රීඩා වෛද්‍ය ඒකකය විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණය සමත් විය යුතුය. එම පරීක්ෂණය, ප්‍රතික්‍රියා වේගය, නම්‍යතාවය, උදරයේ ශක්තිය, දෑත්වල ශක්තිය, උලඟිතාවය, හිටි දුර පැනීම, වේගය හා දරා ගැනීම යන අංශයන්ගෙන් සමන්විත වේ.

*සටහන :-*

පුරප්පාඩු සංඛ්‍යාවට සමාන හෝ ඊට අඩු අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත්වී ඇති විට අවම සුදුසුකම් සපුරා ඇති අයවලුන්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයකට භාජනය කොට ඉන් සමත් වන්නන් පුරප්පාඩු තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

5. *විභාග ගාස්තු :-*

විභාග ගාස්තු වශයෙන් රු. 600 ක් වයඹ පළාතේ පළාත් සභාවේ අංක 2003-02-13 දරන ආදායම් ශිර්ෂයට බැරවන පරිදි තමන් වයඹ පළාතේ පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවා ලබාගන්නා ලද ව.ප.ස.මු/2 ලදුපත අයැදුම්පතට අමුණා එවිය යුතුය. එසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ලදුපත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ. කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව සැලකිය යුතුය. මුදල් ගෙවූ ලදුපතේ ඡායාස්ථ පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

6. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය :-*

6.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කරගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2019.05.24 වැනි දින හෝ එදිනට ප්‍රථම ''ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි, ''වයඹ පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීම-2019'' යනුවෙන් සඳහන් කළ යුතුය.

6.2 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු හෝ රු. 32,960 හෝ රජයේ ඉහළ මාසික වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කළ යුතුවේ.

6.3 අයැදුම්පත් භාරගන්නා අවසාන දිනය 2019.05.24 වේ.

7. මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් වලට අනුකූල නොවන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා කැඳවීමේ ලිපියක් නිකුත් කිරීම අයැදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීක් ලෙස සළකනු නොලැබේ. අයැදුම්කරු සම්මුඛ පරීක්ෂණයට කැඳවා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. සෑම අයැදුම්කරුවෙකුම අදාල සියළුම සුදුසුකම් ඇයැදුම්පත් භාරගන්නා දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

8. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*

අපේක්ෂකයන් තමා පෙනී සිටින ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා තම අනන්‍යතාවය පහත සඳහන් ලේඛනයකින් පරීක්ෂණ මණ්ඩලය වෙත තහවුරු කළ යුතුය :

(1) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ජාතික හැඳුනුම්පත
(2) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

*සටහන* :- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපොහොසත්වන අපේක්ෂකයින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට නුසුදුස්සෙකු ලෙස සළකනු ලැබේ.

09. යම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව පත්වීම ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත. පත්වීම ලැබීමෙන් පසු හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම කරනු ලැබේ.

10. මෙම තනතුර සඳහා තෝරා ගැනීම/නොගැනීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ අවසාන තීරණයද වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ය.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

පද්මිණි කාරියවසම්,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.
2019 අප්‍රේල් මස 17 වැනි දින.

**ආදර්ශ අයදුම් පත්‍රය**

[ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

*වයඹ පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරි III ශ්‍රේණිය තනතුර සඳහා බඳවා ගැනීම - 2019 (විවෘත)*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.)

සිංහල : [ ] දෙමළ : [ ] ඉංග්‍රීසි : [ ]

1. 1.1 මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :..........................................................................................................

..........................................................................................................

1.2 මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................................................

..........................................................................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :..........................................................................................................

..........................................................................................................

1.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................................................

..........................................................................................................

1.5 ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

2. 2.1 ස්ථිර ලිපිනය :..........................................................................................................

..........................................................................................................

2.2 දුරකතන අංකය : පෞද්ගලික :..............................................................

3. ස්ත්‍රී පුරුෂ භාවය (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

ස්ත්‍රී : [ ] පුරුෂ : [ ]

4. උපන් දිනය : වර්ෂය :................... මාසය :....................... දිනය :....................

4.1 අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2019.05.24 වැනි දිනට වයස :

අවුරුදු :.............. මාස :................. දින :..................

5. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :* (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 2.1 යටතේ)

*(අ) අ.පො.ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය හා විභාග අංකය :*

*පළමුවර :- වර්ෂය :*.....................................
*විභාග අංකය :*.....................................

*දෙවන වර :- වර්ෂය :*.....................................
*විභාග අංකය :*.....................................

| *විෂයය* | | *ලබා ඇති සාමාර්ථය* | | | *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* | |
|---|---|---|---|---|---|---|---|
| | | *පළමුවර* | *දෙවනවර* | | | *පළමුවර* | *දෙවනවර* |
| 1 | | | | 7 | | | |
| 2 | | | | 8 | | | |
| 3 | | | | 9 | | | |
| 4 | | | | 10 | | | |
| 5 | | | | 11 | | | |
| 6 | | | | | | | |

*(ආ)* (i) අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය :...........................................

(ii) විභාග අංකය :.............................................

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* | *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |

*(ඉ) වෘත්තීය සුදුසුකම් :*

(නිවේදනයේ අංක 2 සඳහන් වෘත්තීය සුදුසුකම් පිළිබඳව පැහැදිලිව සඳහන් කරන්න.)
මෙම තොරතුරු පැහැදිලිව හා නිවැරදිව සඳහන් කර නොමැති නම් අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| *තරග ඉසව්* | *ලබාගත් ස්ථාන* | *කාලසීමාව* | *සහතිකපත් අංකය හා දිනය* |
|---|---|---|---|
| | | | |

06. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :.......................................................................................
දිනය :.......................................................................................................................................
ලදුපත ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :....................................................................

ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න.

07. ............................................................... වන මා විසින් මෙම අයැදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සඳහන් කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි අනාවරණය වුවහොත් වයඹ පළාත්

සභාවේ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරි III ශ්‍රේණියේ තනතුරට පත්කිරීම සඳහා වූ මාගේ හිමිකම් නොසලකා හරිනු ලැබීමටද, මට විරුද්ධව විනයානුකූල කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි.

..........................................,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :.................................

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම*
(අනවශ්‍ය වචන කපා හරින්න.)

මෙම අයැදුම්පත්‍රය ඉදිරිපත් කරන..............................................................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, විභාග ගාස්තු ගෙවා ඇති බවද ...................................................... අංක දරන ලදුපත අලවා ඇති බවද, ඔහු/ඇය ..........................වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

අත්සන සහතික කරන අයගේ නම :..................................................................................
අත්සන :..................................................................................................................
තනතුර හා නිළ මුද්‍රාව :.........................................................................................

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරි බලයලත් නිළධාරියෙකු හෝ රු. 32,960 මාසික වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කළ යුතු වේ.)

04-1121

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.